# සීමා නිර්ණ මාසයක් ඇතුළත ගැසට් කරනවා

ඉෂාර රත්නකාර

● පළාත් පාලන සීමා නිර්ණ වාර්තාව මාසයක කාලයක් ඇතුළත ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව පළාත් සභා හා පළාත්...

▶ 15 පිටුවට



## සීමා නිර්ණ...

පාලන ඇමැති ෆයිසර් මුස්තාපා මහතා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඊයේ (30දා) දැනුම් දුන්නේය. දිගින් දිගටම ප්‍රමාද වන සීමා නිර්ණය අවසන් කළ පළාත් පාලන ආයතනවල මැතිවරණය කඩිනමින් පවත්වන ලෙසට නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පැෆරල් සංවිධානය ගොනුකර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඊයේ සලකා බැලූ අවස්ථාවේදී පෙත්සමේ වගඋත්තරකාර ෆයිසර් මුස්තාපා මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් ඒ පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත දන්වා සිටියේය.

මේ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් වන ප්‍රියසාද් ඩෙප්, උපාලි අබේරත්න සහ නලින් පෙරේරා යන මහත්වරුන්ගෙන් සැදුම්ලත් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ සලකා බැලිණි.

පෙත්සමට අදාළ ප්‍රගතිය විමසීමට එය ලබන මාර්තු 13 වැනි දින යළි කැඳවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය නියම කෙළේය.

පැෆරල් සංවිධානය ගොනුකර තිබූ මේ මූලික අයිතිවාසිකම් පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිසමේ නිලධාරීන්, විෂය භාර ඇමැති ෆයිසර් මුස්තාපා මහතා සහ නීතිපතිවරයා නම් කර තිබිණි.